145029
KVD
24.03.98
Rs. 200/

# ශ්‍රී ලංකාවේ පහතරට තොවිල්වල භාවිත වන බෙර වාදන ශිල්ප ක්‍රම පිළිබඳ සමාජ සංස්කෘතික අධ්‍යයනයක්

පී.එම්.කරුණාරත්න බණ්ඩා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය.

ලි.ප.අංක ඒ.16593

CR

භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ

1996

145029

# සාරාංශය

ශ්‍රී ලංකාවේ පහතරට තොවිල්වල භාවිත බෙර වාදන ශිල්පක්‍රම පිළිබඳ අධ්‍යයනයක් කිරීම මෙම නිබන්ධනයේ අරමුණ විය. මෙය පරිච්ඡේද ෂයකට සීමා කර කරුණු සාකච්ඡා කිරීමට අපි උත්සාහ කෙළෙමු.

පළමු වැනි පරිච්ඡේදය බෙරයේ උපත ගෙනහැර දැක්වීම සඳහා වෙන් කෙරේ. එහි දී ආදි මානවයා ධ්වනි පිළිබඳ අවබෝධ කරගත් මූලික අවධියේ සිට බෙරය වර්තමානයේ පවතින තත්ත්වය දක්වා සිදු වූ විකාශන ක්‍රියාවලිය අවධි සතරක් යටතේ විග්‍රහයට ලක් කෙරේ.

දෙ වැනි පරිච්ඡේදය වෙන් වන්නේ සිංහල සංස්කෘතිය තුළ බෙරය භාවිත වූ ආකාරය පිළිබඳ තොරතුරු ගෙනහැර දැක්වීමට ය. ඒ සඳහා සාහිත්‍ය මූලාශ්‍රයන් හා චිත්‍ර, මූර්ති, කැටයම් පාදක කොටගෙන ඇත. මෙහි දී අප ගේ අධ්‍යයනයට ප්‍රස්තුත වන්නා වූ පහතරට බෙරය ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ ස්ථාපිත වූ ආකාරය පිළිබඳ ව ද විග්‍රහ කෙළෙමු.

තෙ වැනි පරිච්ඡේදය තුළින් පහතරට බෙරයක් නිර්මාණය කර - ගන්නා ආකාරය පිළිබඳ පුළුල් විග්‍රහයක් කෙළෙමු. එහි දී බෙර නිර්මාණ ක්‍රියාවලියට අයත් ගසක් තෝරා ගැනීමේ සිට බෙරය වාදනයට ගන්නා අවස්ථා- ව දක්වා පියවරෙන් පියවර චිත්‍ර සටහන් උපයෝගී කොට ගෙන විග්‍රහ කෙරේ.

සිව්වන පරිච්ඡේදය වෙන් කළේ පහතරට බෙරයේ ධ්වනි පිළිබඳ විග්‍රහයක් කිරීමට ය. එහි මූලික ධ්වනි ලෙස සැලකෙන තත් , දිත් , තොං, තං යන බීජාක්ෂර සතර හා සම්බන්ධ ජනශ්‍රැතිය ගෙනහැර දක්වා ඇත. ඒවා බෙරයෙන් උපදවා ගන්නා ආකාරය සහ නර්තනය අතර සම්බන්ධය විග්‍රහයට

ලක් කර ඇත. අනතුරු ව පහතරට බෙරපද නිර්මාණය සහ එහි භාෂාත්මක ලක්‍ෂණ සලකා බැලෙන අතර පරිගණක යන්ත්‍ර මගින් මූලික ධ්වනි හා සම්බන්ධ භෞතික විද්‍යාත්මක ලක්‍ෂණ පිළිබඳ ව අධ්‍යයනයක් ද ඊට අන්තර්ගත ය.

පස් වැනි පරිච්ඡේදයෙන් පහතරට තොවිල්හි බෙර වාදනය පවතින ආකාරය පිළිබඳ විග්‍රහයක් කෙරේ. ඒ තුළින් පහතරට බෙරය ශාන්තිකර්මයන්හි පුදපූජා රටාවන් හා අත්‍යන්තයෙන් බැඳී පවතින අයුරුත් ඒ හා බැඳි ශිල්ප ක්‍රම ආශ්‍රිත බෙර වාදන ඉරියව් පිළිබඳවත් සාකච්ඡා වේ.

හය වැනි පරිච්ඡේදයෙන් පහතරට බෙර වාදනය සහ සිංහල ගැමි සමාජය අතර සම්බන්ධය සාකච්ඡා කෙරේ. එහි දී පහතරට බෙර වාදන වර්තමානය දක්වා පවත්වාගෙන ඒමට මූලික වූ ගුරු පරපුරවල් සහ ගුරු කුල අධ්‍යාපන රටාව විග්‍රහයට ලක් වේ. අනතුරු ව සිංහල සංස්කෘතියේ බෙර වාදකයාට හිමිවන ස්ථානය පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරෙන අතර එහි වර්තමාන තත්ත්වය ද මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක්කොට ඇත.

## පටුන


පිටු අංක

හැඳින්වීම v - xi

උපකාරානුස්මෘති xii - xiii

සාරාංශය xiv - xv

ප්‍රවේශය xvi-xxvi

සංකේත සූචිය xxvii-xxix

පළමු වැනි පරිච්ඡේදය

බෙරයේ ඓතිහාසික පසුබිම

අද්‍රව්‍යමය ධ්වනි අවධිය - ප්‍රකෘති ද්‍රව්‍යමය ධ්වනි අවධිය - නිර්මාණාත්මක ද්‍රව්‍යමය ධ්වනි අවධිය - භේරිමය ධ්වනි අවධිය හෙවත් බෙරයට හම් යෙදූ අවධිය - විවිධ හම් භාවිතය - බෙර කඳේ හැඩය - බෙර වාදන ක්‍රම - ධ්වනි සකස් කර ගැනීම. 01- 24

දෙ වැනි පරිච්ඡේදය

බෙරය හා සිංහල සංස්කෘතිය, විදේශීය සංස්කෘතීන් අතර සම්බන්ධය

සමාජයීය අවස්ථා හා සම්බන්ධ බෙර වාදන - ආගමික අවස්ථා හා සම්බන්ධ බෙර වාදන - ශ්‍රී ලාංකික බෙරය පිළිබඳ චිත්‍ර මූර්ති කැටයම්වලින් හෙළිවන තොරතුරු - සිංහල ගැමි ශාන්තිකර්මවල බෙර වාදන සම්ප්‍රදාය ගොඩනැඟුණු ආකාරය - පහතරට බෙරය කෙරෙහි විදේශීය බලපෑම් 25- 67


CR

තෙ වැනි පරිච්ඡේදය
==============

පහතරට තොවිල්වල භාවිත වන බෙරයේ නිර්මාණය

පහතරට බෙර නිර්මාණය සඳහා යොදා ගන්නා උපකරණ - බෙරකඳ හැරීම - බෙරකඳ ලියවීම - බෙර කට සැකසීම - බෙරහම සැකසීම - වරපට සැකසීම - කැපුම්හම සැකසීම - වෙනිවර සැකසීම - ගැටිය ගෙතීම - කන්වරය සැකසීම - වරපොට යෙදීම - ගැටිවැල සැකසීම - බොකුහම් තෝරා ගැනීම - බෙර තට්ටු දැමීම හෙවත් බොකුහම යෙදීම - බෙර ලණුව සැකසීම - හඬ සකස් කිරීම. 68–106

සිව් වැනි පරිච්ඡේදය
==============

පහතරට බෙරයේ ධ්වනි නිෂ්පත්තිය

පහතරට බෙරයේ මූලික ධ්වනි පිළිබඳ විග්‍රහය–පහතරට බෙරයේ මූලික ධ්වනි හා බැඳි ජනශ්‍රැතිය - පහතරට බෙරයේ ධ්වනි නිෂ්පත්තිය හා නර්තනය අතර ඇති සම්බන්ධය - පහතරට බෙරයේ ධ්වනි සංකේත - පහතරට බෙරයේ අක්ෂර හා පද නිර්මාණය - බෙර පදවල අන්තර්ගත භාෂාමය ලක්ෂණ - පහතරට බෙරයේ මූලික ධ්වනිවල අන්තර්ගත භෞතික විද්‍යාත්මක ලක්ෂණ 107–166

පස් වැනි පරිච්ඡේදය
==============

පහතරට තොවිල්වල භාවිත වන බෙර වාදන ශිල්ප ක්‍රම

ගායනය පාදක කොටගත් බෙර වාදන - ආඝාතාත්මක ගායනය සඳහා කෙරෙන බෙර වාදන - අනාඝාතාත්මක ගායනය සඳහා කෙරෙන බෙර වාදන, අනාඝාතාත්මක ගායනයන්හි දී ආඝාතාත්මක ව කෙරෙන බෙර වාදන - අනාඝාතාත්මක ගායනයන්හි දී අනාඝාතාත්මක ව කෙරෙන බෙර වාදන - නර්තනය පාදක කොටගත් බෙර වාදන - පූජාර්ථයෙන් කෙරෙන බෙර වාදන -නාට්‍යමය අවස්ථා හා බැඳි බෙර වාදන - ගුප්ත ස්වභාවය ජනිත කෙරෙන බෙර වාදන - ගුප්ත ස්වභාවය ජනිත කෙරෙන ධ්වනි සංගීතීන්හි ඇති විශේෂතා - වාදනය කෙරෙන තාල හා ලයෙහි විශේෂතා - පහතරට තොවිල්වල බෙර වාදන ශිල්ප ක්‍රම හා බැඳි ඉරියව් - සිට ගෙන බෙර වැයීමේ ඉරියව් - හිඳගෙන බෙර වැයීමේ ඉරියව් - හයි තට්ටුව සුරල් තට්ටුවට වඩා මඳක් ඉහළට එසවෙන සේ තබා ගනිමින් කෙරෙන වාදනය - බෙරය පොළොවට සමාන්තර ව සිටිනුසේ තබා ගනිමින් කෙරෙන වාදනය - හිඳගෙන බෙර වාදනය කිරීමේ ඉරියව්. 167-231

හය වැනි පරිච්ඡේදය
==============

පහතරට බෙරය හා සිංහල ගැමි සමාජය 232-247

| | |
|---|---|
| නිගමනය | 248-250 |
| උපග්‍රන්ථය | 251-273 |
| චිත්‍රාවලිය | 274-292 |
| ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය | 293-304 |
| සූචිය | 305-366 |